# මහායාන භික්ෂුණී ආරාමයක් ලෙස සැළකෙන පන්කුලිය හෙවත් අශෝකාරාමයේ පුරාවිද්‍යාත්මක වටිනාකම පිළිබඳ විමසුමක්

ඩබ්.එම්. චින්තක සඳරුවන්, ටී.එච්.පී.ඒ.කේ. ජයසූරිය, ආර්.පී.එස්.එස්. පතිරණ

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

ප්‍රමුඛ පදඃ පන්කුලිය, පබ්බතාරාමය, පුරාවිද්‍යාත්මක වටිනාකම

## හැඳින්වීම

ක්‍රි.පූ 3 වැනි සියවසේ මෙ රට බෞද්ධාගමික මුහුණුවරක් යටතේ හැඩගැසීමට ලක්වන අතර ක්‍රි.ව. පළමු වැනි සියවසවන විට නිකාය භේදය උග්‍ර වීමත් සමග මහායාන සම්ප්‍රධාය මත පදනම් වූ උප ආගමික ආයතන ගණනාවක් බිහි වනු හඳුනාගත හැකි ය. අභයගිරි නිකාය ගුරු කර ගනිමින් මහසෙන් සමයේ ගොඩනැගුණු පබ්බතාරාමයක් ලෙස අශෝකාරාමය හෙවත් පන්කුලිය හඳුනාගන්නා අතර එය භික්ෂුණී ආරාමයක් ලෙස ද විද්වතුන් විසින් හඳුන්වා දී ඇත. බෞද්ධ ආරාම සැලසුම් සම්ප්‍රධායේ **පබ්බතාරාම** ගණයට අයත්වන පන්කුලිය පබ්බතාරාමයේ ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, වාස්තුවිද්‍යාත්මක හා ආගමික වටිනාකම් හඳුනා ගැනීමත් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වසන් වී ඇති තොරතුරු සමාජගත කිරීමත් මෙම අධ්‍යයනයේ මුඛ්‍ය අරමුණු හා පරමාර්ථ වේ.

## ක්‍රමවේදය

පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු බිම්කඩක් වූ පන්කුලිය පිළිබඳ අධ්‍යනයේ දී සාහිත්‍ය මූලාශ්‍ර ගවේෂණය, ක්ෂේත්‍ර ගවේෂණය, සම්මුඛ සාකච්ඡා හා අන්තර්ජාල ගවේෂණ මාර්ගයෙන් තොරතුරු ඒකරාශි කර ගැනීම සිදු කළ අතර ගූගල් අර්ත්, මයික්‍රෝසොෆ්ට් ඔෆිස්, මයික්‍රෝසොෆ්ට් පවර්පොයින්ට් හා ෆොටෝ ෂොප් ආදී මෘදුකාංග භාවිතයෙන් අවසන් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

## ප්‍රතිඵල සහ සාකච්ඡා

දේවානම්පිය තිස්ස රාජ (ක්‍රි.පූ. 250-210) සමයේ මෙරට බෞද්ධ සංඝාරාම නිර්මාණයේ ආරම්භය සනිටුහන් වන අතර පබ්බත විහාරාරාමයන්ගේ ආරම්භය පිළිබඳ නිශ්චිතව හඳුනාගත නොහැකි වුවත් එහි පළමු අවස්ථාව ලෙස මහානාග රජු (ක්‍රි.ව 9-21) දවස රුහුණු ජනපදයේ **'මිණිනාපව්'** නම් විහාරයක් කළ බව සඳහන් වේ (ම.ව. ෲසඩ). පබ්බතාරාම නිර්මාණය පිළිබඳ ව සම්පූර්ණ වූ විස්තරයක් ක්‍රි.ව. 5-7 සියවස්වල රචනා කරන්නට ඇතැයි සිතිය හැකි **'මංජු ශ්‍රී භාෂිත වාස්තු විද්‍යා ශාස්ත්‍රය'** නම් ග්‍රන්ථයේ ද සඳහන් වේ. පබ්බතාරාමයක් ලෙස සරලව හඳුනාගත හැක්කේ **'චෛත්‍යය, බෝධිඝරය, පටිමාඝරය, උපෝසතඝරය යන ප්‍රධාන ආගමික ගොඩනැගිලිවලින් යුක්ත සතර වට පිරිකෙව් කරන ලද පවුරකින් යුක්ත නිශ්චිත ව සැලසුම් කරන ලද ආරාම විශේෂයක්'** ලෙස සරල ව සඳහන් කළ හැකි ය (ජයවීර, 2001:14). මෙම ආරාම සැලැස්ම වටා නේවාසිකාගාර, භෝජන ශාලා, ජලස්නාන ගෘහ, කැසිකිළි වැසිකිළි ආදී වෙනත් ඉදි කිරීම් ද හඳුනාගත හැකි වේ (එම). මෙම විහාර සැලැස්ම **'පවත වෙහෙර'** (පරණවිතාන, 1940:45.23), **පව් වෙහෙර** (බෙල්, 1899:5), **ගිරි වෙහෙර** (ෟ', 266), ආදී නම් වලින් ද හඳුන්වනු ලැබේ.

මෙම විහාර සම්ප්‍රදාය පිළිබඳ ව ලංකාව ආශ්‍රයෙන් පර්යේෂණ ඇරඹෙන්නේ 1891 වර්ෂයේ දී එච්.සී.පී. බෙල් විසිනි. 1928 වර්ෂයේ දී හෝර්කාට් විසින් ද 1941 දී පරණවිතාන විසින් ද පුළුල් ව පර්යේෂණ කර ඇත.

පර්යේෂණයට බඳුන් වූ අශෝකාරාමය පිළිබඳ ජනප්‍රවාද සාධක අනුව සාලිය කුමාරයා ස්වකීය භාර්යාව වූ අශෝකමාලාවගේ නමින් අශෝකාරාමය කරවන ලද බව සඳහන් වේ (සිංහල ශබ්ධ කෝෂය 1965:270). ශිලා ලේඛලන සාධක අනුව භික්ෂුණී ආරාමයක් ලෙස පන්කුලිය හඳුනාගන්නා අතර (හේමලතා, 2014:19) භික්ෂුණීන් සඳහා ද මෙහෙණවර පුජා කිරීමේ ආරම්භය දේවානම් පිය තිස්ස රාජ්‍ය සමය (ක්‍රි.පූ 250-210) දක්වා ම දිවයයි. මහාවංසයේ සඳහන් වන පරිදි ක්‍රි: වː 266 ට ආසන්න කාලයේ දී මහසෙන් රජු (ක්‍රි.ව 276 -303) විසින් මෙහෙණවරක් කළ බව සඳහන් වේ. එසේම එය උත්තර මෙහෙණවර හෙවත් උතුරු දෙසින් පිහිටි මෙහෙණවර ලෙස හඳුනාගත හැකි අතර එය වර්තමාන පංකුලිය ලෙස හඳුනාගනී (එම).

පන්කුලිය අශෝකාරාමය පිළිබඳ ව මුලින් ම ගවේෂණය කර ඇත්තේ 1892 වර්ෂයේ දී එච්.සී.පී. බෙල් විසිනි. මෙය භික්ෂුණී මෙහෙණවරක් බවට සනාථ කරන ශිලා ලේඛනයක් ද ජන්තාඝරයට බටහිර දිශාවේවන ගොඩනැඟිල්ලක් අසලින් හඳුනාගෙන ඇත (හේමලතා, 2014:23). විහාරය අයත්වන කාලය පිළිබඳ ව අදහස් දක්වන පරණවිතාන මහතා පවසන්නේ මෙම ක්ෂේත්‍රය පුරා විසිරී ඇති මුරගල්, සඳකඩපහන්, කොරවක්ගල් හි ලක්ෂණ අනුව මෙම අංගයන්ගේ ආරම්භක අවස්ථාවේ සිට කාලානුරූපිව සංවර්ධනය වී ඇති බවයි (ඡර්බඩසඑය්බ්ල 1946:39-44). ආරාමයේ ඇති උපෝසතඝරය පිළිබඳව අදහස් දක්වන ලගමුව දක්වන්නේ වරකට භික්ෂුණීන් 210කට පමණ උපෝසත කර්ම කළ හැකි බවයි (ලගමුව, 2002:37). පන්කුලියේ ඇති සමාධි පිළිමය 1887 වර්ෂයේ දී ආර්.ඩබ්. අයිවර්ස් විසින් සොයාගත් බව සඳහන් වේ (හේමලතා, 2014:58). පරණවිතාන මහතා මෙහි ඇති බුද්ධ ප්‍රතිමාව ක්‍රි.ව. 6 වැනි සියවසට අයත් වන බව සඳහන් කර ඇතත් ඒ සඳහා සාක්ෂි ඉදිරිපත් කර නොමැත (එම, 23). මෙහි ඇති බුද්ධ ප්‍රතිමා ලක්ෂණ අනුව ක්‍රි.ව. 4 වැනි සියවසට අයත්වන බව ඩී.ටී. දේවේන්ද්‍ර මහාතා විසින් පර්යේෂණය කර සඳහන් කර තිබේ (දේවේන්ද්‍ර, 1967:40). වික්‍රමගමගේ මහතා මෙම බුද්ධ ප්‍රතිමාව ක්‍රි.ව. 8 වැනි සියවසට අයත්වන බව සඳහන් කර ඇත (වික්‍රමගමගේ, 2000:180). අනුරාධ සෙනවිරත්න දක්වන පරිදි මෙම බුද්ධ ප්‍රතිමාව ක්‍රි.ව. 9-10 වැනි සියවසට අයත්වන බව සඳහන් කරයි (සෙනවිරත්ත, 2002:180).

මහායාන සංකල්පය අනුව නිර්මාණය වී ඇති භික්ෂුණී ආරාමයක් ලෙසින් හඳුනාගත හැකි පන්කුලිය පබ්බතාරාමය වර්තමානය වන විට බෙහෙවින් විනාශයට පත් වී ඇති බව හඳුනාගත හැකි ය. ලංකාවේ මේවන විට භික්ෂුණී ආරාම පිළිබඳ ව සාධක පවතින්නේ අල්ප වශයෙනි. එවැනි වැදගත් පුරාවිද්‍යාත්මක සාධක හමුවන පබ්බතාරාමයක් වන මෙහි ජන්තාඝරය, ප්‍රතිමාඝරය, දිග්ගේ, ස්තූපය ආදී ස්මාරක නෂ්ටාවශේෂ බවට පත් වී ඇති අතර ඓතිහාසික, පුරාවිද්‍යාත්මක හා ආගමික මෙන්ම කලාත්මක වටිනාකමින් යුත් ස්මාරක බෙහෙවින් විනාශයට පත් වී ඇති අතර එම අගයන් ආරක්ෂාකර ඉදිරියට පවත්වාගෙන යාම උදෙසා මෙම ස්මාරකයන් අදාල ආයතන හා පුද්ගලයන්ගේ මැදිහත්වීම මගින් විධිමත් පරිදි හඳුනාගනිමින් වාර්තාගතකර ඉදිරි සංරක්ෂණ කාර්යයන්වලට යොමු කිරීම කළ යුතු බව දැක්විය හැකි ය.